# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,516 — 1965 සැප්තැම්බර් 29 වැනි බදාදා — 1965.9.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1965 අංක 366**

අ. ආ. කා. අංකය : සී. 270/65(2).

මුදල් ඇමති, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු උක්කු බණ්ඩා වන්නිනායක මහතා, දිවයිනට පෙරළා පැමිණෙන තුරු, පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ජූනියස් රිචඩ් ජයවර්ධන මහතා වෙනුවට, අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, 1946 යේ හා 1947 තේ, ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 49 වැනි වගන්තිය යටතේ, ගරු මුදල් ඇමතිතුමන්ගේ පාර්ලිමේන්තු ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී, නන්එදිරි විමලසේන මහතා, 1965 සැප්තැම්බර් 29 වැනි දින සිට මුදල් ඇමති වශයෙන් වැඩ බැලීමට පත්කළ බව, මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 සැප්තැම්බර් 29 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.
10–233

**1965 අංක 367**

අ. ආ. කා. අංකය : සී. 270/65 (2).

ජනසතු සේවා ඇමති, පාර්ලිමේන්තු මන්ත්‍රී, ඇම්.බී.ඊ. නාමධාරී, ගරු විතාන ආරච්චිගේ සුගතදස මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 49 වැනි වගන්තිය යටතේ, ගරු ජනසතු සේවා ඇමති තුමාගේ පාර්ලිමේන්තු ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී, ඩිංගිරි බණ්ඩා වෙලගෙදර මහතා, 1965 සැප්තැම්බර 28 වැනි දින සිට, ජනසතු සේවා ඇමති වශයෙන් වැඩ බැලීමට පත් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 සැප්තැම්බර 28 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.
10–234

# මිල පාලන දැන්වීම්

**සී. 401 වැනි අංකය දරණ ආහාර මිල නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය**

## මිල පාලන පනත

### නියෝගය

මිල පාලක (ආහාර) තැන්පත් පින්නදූවගේ ආතර් සිල්වා වන මම, (173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිල පාලක (ආහාර) වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1965 ජනවාරි 20 වෙනි දින අංක 14,295 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1965 ජනවාරි 20 වෙනි දින අංක සී 397 දරණ ආහාර මිල නියෝගය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යය මෙරටට ගෙන්වන්නෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩීම මිළ මේ දුන් පටන් මේ උපලේඛනයේ 2 වෙනි, 3 වෙනි හා 4 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩීම මිළ ගණන් නියම කරුණු ලැබූ සෑම ප්‍රදේශයක ම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩීම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩීම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩීම මිළ ඕනෑම ගණුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා "රාත්තල" හෙවත් "රා." යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩීම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය එනම්, වෙළෙඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යනවග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත් උපලේඛනයේ 2 වෙනි 3 වෙනි හා 4 වෙනි තීරවල සඳහන් වැඩීම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

1965 සැප්තැම්බර් 28 වෙනි දින අ.භා. 4.30 ට කොළඹදී අත්සන් කරණ ලදී.

පී. ඒ. සිල්වා,
මිල පාලක (ආහාර).

## උපලේඛනය

| 1 වැනි තීරය<br>වර්ගය | 2 වැනි තීරය<br>මෙරටට ගෙන්වන්නකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩීම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩීම මිළ<br>රු. ශ. | 4 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකිවැඩීම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| ළූනු (රතුළූනු සහ බික්බෙලාපූර් හැර වෙනත් සියලුම) ... ... | 23 0 ... | 24 0 ... | 0 28 |
| කොත්තමල්ලි ... ... ... ... | 45 60 ... | 47 0 ... | 0 48 |
| පියළි නොකළ උළුඳු ... ... ... ... | 44 0 ... | 45 25 ... | 0 46 |
| මුං ඇට ... ... ... ... | 39 50 ... | 40 75 ... | 0 41 |
| තෝර පරිප්පු ... ... ... ... | 47 75 ... | 49 0 ... | 0 50 |
| කඩල පරිප්පු ... ... ... ... | 46 25 ... | 47 50 ... | 0 48 |
| සියඹලා ... ... ... ... | 42 0 ... | 44 0 ... | 0 50 |
| අර්තාපල් ... ... ... ... | 24 0 ... | 25 0 ... | 0 27 |
| රතුළූනු ... ... ... ... | — ... | 24 0 ... | 0 28 |

**සැළකිය යුතුයි.—(1) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩීම මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නො හැකි ය.**

**(2) මෙරටට ගෙන්වන්නෙකු විසින් අය කරන මිළ හොණ්ඩර 10ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකුණන විට අය කරන මිළ විය යුතුය.**

10–217

ලංකාවේ වැලිවේරියෙහි පිහිටි "රීජ්වර්ත් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි